# ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දඩයම් ක්‍රම හා අභිචාර විධි

## Traditional Hunting Methods and Retuals in Sri Lanka

**පාහියංගල සුමංගල හිමි**


## Abstract

Traditional hunting methods in ancient Sri Lanka can be identified islandwide. But, today these huniting methods are very rare. The villagers avoid even teaching the new generation such hunting methods. These hunting methods are currently used in a few villages. In addition to hunting, there are many hunting rituals in different villages. This research was conducted to study the traditional hunting methods and ritual of Sri Lanka.


**Keywords :** hunting, rituals, traps, hunter, share


**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දඩයම් රටාව දිවයින පුරාම පැවැත ඇත. වර්තමනාය වන විට මෙම දඩයම සහ ඒ ආශ්‍රිත අභිචාර වියැකෙමින් පවතින අතර දිවයිනේ ප්‍රදේශ කිහිපයක පමණක් එය දැකගත හැකිය. වර්තමාන සමාජය තුළ මෙම දඩයම් ක්‍රම සහ ශිල්පීය ක්‍රම අනාගත පරම්පරාවට ඉගැන්වීමට කටයුතු කරන අවස්ථා දුලබය. ප්‍රදේශ අනුව දඩයම් ක්‍රම සහ අභිචාර වෙනස් වන අවස්ථාද පවතී. මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ පැවැති සාම්ප්‍රදායික දඩයම සහ අභිචාර පිළිබඳව අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ.


**යතුරු පද :** දඩයම, අභිචාර, උගුල, දඩයක්කරුවා, පංගුව

**හැඳින්වීම**

අතීත ජන සමාජවල මිනිසුන් තම ජීවිකාව ගැටගසා ගැනීම සඳහා විවිධ ආහාර වර්ග රැස්කළ බව ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක

මූලාශ්‍ර අනුව පැහැදිලි වේ. මිනිසා මුල් කාලයේ පහසුවෙන් සොයාගත හැකි දේ ආහාරයට ගැනීමට හුරුවන්නට විය. විවිධ දෑ එක් රැස්කර ගැනීමෙන් ආහාරයට ගත් මොවුන් අහඹු ලෙස හමු වූ සතෙකු හෝ මිය ගිය සතෙකු ආහාර වශයෙන් ගැනීමට ද ක්‍රමයෙන් මොළයේ වර්ධනයත් චින්තන ශක්තීන්හි මෙහෙය වීමත් තුළ මිනිසා දඩයම සඳහා විවිධ උපක්‍රම අත්හදා බැලීමටත් යොමු විය. ඔවුන්ගේ ආහාර රැස්කර ගැනීමේ එක් ක්‍රමවේදයක් වූයේ දඩයම මගින් දඩමස් ලබාගැනීමයි. ජීවත් වන පෙදෙස් තුළ දඩමස් සඳහා විවිධ සතුන් දඩයක්කරුවන් විසින් තෝරාගෙන තිබුණි. හේන් ගොවියා, සාමාන්‍ය ගැමියා සහ දඩයක්කරුවා දඩයම සඳහා විවිධ දඩයම් උපක්‍රම රාශියක් භාවිත කළහ. මෙම අත්හදා බැලීම්වල වසර දහස් ගණනක විකාශනය තුළින් ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දඩයම් ක්‍රමවේදයන්හි සුවිශේෂතා හඳුනාගත හැකිය.

ශ්‍රී ලංකාවේ පුරාණ සමාජයේ දඩයම කෙබඳු වීද යන්න මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පැරණි ජන සමාජවල පැවැති සාම්ප්‍රදායික දඩයම් රටාව පිළිබඳ අධ්‍යයනය කිරීම වේ. පැරණි ජන සමාජවල වියැකෙමින් පවතින දඩයම සහ ඒ ආශ්‍රිත අභිචාර විශ්වාස පර්යේෂණය කිරීම තුළින් අනාගාතයට එය සුරක්ෂිත කිරීම මෙහි වැදගත්කම ලෙස පෙන්වාදිය හැකිය.

**සාහිත්‍ය විමර්ශනය**

ශ්‍රී ලංකාවේ පැරණි දඩයම් ක්‍රම පිළිබඳව විදේශීය ලේඛකයන් කිහිප දෙනෙකුම තොරතුරු වාර්තා කර ඇත. ඒ අතරින් එදා හෙළ දිව (An Historical Relation of the Island of Ceylon) ග්‍රන්ථය රචනා කරන ලද රොබට් නොක්ස් එම ග්‍රන්ථයේදී පැරණි ජන සමාජයන් තුළ පැවැති සතුන් දඩයම් කිරීම විස්තර කර ඇත. වල් ඌරන්, මුවන්, පක්ෂීන්, මත්ස්‍යන් වැනි සතුන් දඩයම් කර ගන්නා ආකාරය සහ ඒ සඳහා භාවිත උපකරණ පිළිබඳවද පැහැදිලි කර ඇත (නොක්ස්, 2017, 114-131). ඇල්ෆ්‍රඩ් ක්ලාක් විසින් රචිත ලක්දිව වනගත දඩකෙළි (Sports in the Low-country of Ceylon) ග්‍රන්ථය මගින්ද පැරණි දඩයම් ක්‍රම කිහිපයක් දක්වා ඇත. දඩයම සඳහා අවසර ඇති

සතුන් පිළිබඳවද දක්වා ඇති අතර නිදසුනක් ලෙස රතු මුවා දඩයම් කරන්නේ නම් ඒ සඳහා අවසර පත්‍රයක් ලබාගත යුතුය (ක්ලාක්, 2006, 69). දඩයම සඳහා යා යුතු ප්‍රදේශ, සුදුසු කාලය, නවාතැන් ගැනීම, ගෙන යා යුතු බඩුබාහිරාදිය, ඇඳුම්, වැනි දෑ ගැනද සඳහන් කර ඇත (ක්ලාක්, 2006, 112-118). ජෝන් ඩේවි විසින්ද ශ්‍රී ලංකාවේ සංචාරය කරන අතර තුර සාමාන්‍ය ජනයා භාවිත කළ දඩයම් ක්‍රම කිහිපයක් පිළිබඳව ජෝන් ඩේවි දුටු ලංකාව ග්‍රන්ථයේ දක්වා ඇත. දේශීය විද්වතුන් වන නන්දේව විජේසේකර ලංකා ජනතාව නම් ග්‍රන්ථයෙන් සාම්ප්‍රදායික දඩයම් සහ අභිචාර ක්‍රම පිළිබඳව පර්යේෂණාත්මකව ඉදිරිපත් කර ඇත. එම්. කරුණාතිලක සහ ගාමිණී රණසිංහයන්ද පර්යේෂණ පත්‍රිකා දෙකක් පුරාවිද්‍යා වාර්ෂික සමුළුව වෙත ඉදිරිපත් කරමින් ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දඩයම පිළිබඳව ප්‍රදේශ දෙකක් කේන්ද්‍ර කරගනිමින් අධ්‍යයනය කර ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා යොදාගන්නා පර්යේෂණ ක්‍රමය වන්නේ ගුණාත්මක පර්යේෂණය යටතේ වන සන්ධාර විශ්ලේෂණ (content analysis) ක්‍රමයයි. මෙහිදී විස්රාත්මක සන්ධාර විශ්ලේෂණ ක්‍රමය මේ සඳහා සුදුසුම ක්‍රමය වේ.

**සාකච්ඡාව**

හේන් ගොවිතැනේදී සහ කුඹුරු ගොවිතැනේදීත් ගම්වැසියෝ නොයෙක් විශ්වාසයන්හි එල්බගෙන කටයුතු කළහ. තම ජීවිතයට බලපාන සෑම කාර්යයක්ම කිරීමේදී ඔවුහු එකී විශ්වාස තරයේ විශ්වාස කළහ. දඩයම පිළිබඳවද ඔවුහු එවැනිම විශ්වාසවල එල්බගෙන ක්‍රියා කළහ. දඩයම් කටයුතුවලදී ඔවුහු සුභ අසුභ බලා එකී ගමන පිටත්විය යුතු බවට වූ තදබල විශ්වාසය ගරුකොට ගත්හ. තමන් දඩයමට යාමට සැරසී ගෙදරින් එළියට එනවිට හූණකු හැඬීම, තුවක්කුව කුමක හෝ වැදීම සහ කකුල කුමක හෝ වැදී තුවාල වීම ඔවුන් සැලකුවේ අසුභ පෙර නිමිත්තක් ලෙසිනි (කරුණාතිලක, 2009: 184). එපමණක් නොව සතුන් දඩයමේදී මර යෝග සහ රාහු කාලයද සැලකිය යුතු බවට ඔවුහු විශ්වාස කළහ.

එමෙන්ම හඳ මෝරන කාලයේදි ඔවුන් දඩයමේ යාමට යොදාගෙන තිබේ. එවැනි දිනවල ගියවිට සතුන් නොවඩුව මුණ ගැහෙනවා යන විශ්වාසය තිබිණි. එමෙන්ම සිකුරාදා සහ අඟහරුවාදා දිනවල දී තමන්ට යහමින් දඩයම් ලැබෙන බවත්, අනෙක් දිනවලට වඩා පහසුවටත්, ලෙහෙසියටත් ඒ දිනවල සතුන් දඩයම් කළ හැකි බවත්, සතුන් මුණ ගැසීම ඉතා පහසුවෙන් සිදුවන බවටත් ඔවුන් විශ්වාස කළහ. එමෙන්ම කිසිදු කරදරයකින් තොරව සතුන් මරාගෙන නිවෙස්වලට ආපසු පැමිණීමටද හැකි යයි ඔවුන් තුළ විශ්වාසයක් පැවතිණ. ඔත්තේ දිනවල දඩයමේ යාම ප්‍රතිඵල සහිත බවත්, ඉරට්ටේ දිනවල දඩයමේ යාම ප්‍රතිඵල රහිත බවත් ඔවුහු විශ්වාස කළහ. ඉරට්ටේ දිනක දඩයමේ ගිය විට සතුන් මුණනොගැසී සතකු මරා ගැනීමට නොහැකි වී මුළු ගමනම තේරුමක් නැති ගමනක් බවට පත්වේ. එසේ නොමැති ඔත්තේ දිනක ගියහොත් නියතයෙන්ම තමන් බලාපොරොත්තු වන දඩයම් ලැබෙන බව ඔවුහු තදින්ම විශ්වාස කළහ.

දඩයම අතරතුරදී අලියා, වලසා, කොටියා වැනි නපුරු සතුන්ගෙන් හා සර්පයින්ගෙන් ද බේරීමට සිදුවේ. එවැනි සියලු සතුන්ගෙන් බේරීමට ඔවුන් තුවක්කුවට වඩා විශ්වාස තබා තිබුනේ මන්තර කෙරෙහි ය. මන්ත්‍රකරුවකු මැතිරූ විට එවැනි සතුන් කලන්තය සෑදී දපණේ වැටෙන තත්ත්වයකට පත්වන අතර සමහර සතුන් වහ වහා මාර්ගයෙන් ඉවත්ව වේ. තවත් සතුන් ඔවුන් යන පැත්ත පළාතකටවත් පැමිණෙන්නේ නැත. ඔවුහු ඒ තරමටම මේ මන්ත්‍ර කෙරෙහි විශ්වාස තැබූහ. එපමණක් නොව සතුන් තමන්ට නොලැබී යන විට මොර කොලවලට මතුරා පූවළක කැරකීමට සලස්වා සතුන් එදින දඩයමට හමුවනවා ද නැද්ද යන්න දැනගෙන තිබේ. එමෙන්ම කැලේට ඇතුල්වන ස්ථානයේදී මොර අත්තකට මතුරා එකී අත්ත තමන් යන පැත්ත හරහා එල්ලා තැබීමෙන් ඔවුහු සර්පයින්ගෙන් ආරක්ෂා වෙතැයි විශ්වාස කළහ.

දඩයම පහසුකර ගැනීම සඳහා දඩ බල්ලන්ගේ සහ දඩ මීමුන්ගේ සහයෝගය ලබා ගත්හ. පුරුදු කළ දඩ බල්ලන් ඔවුන්ගේ ජීවිතයේ එක් අංගයක් වූ තරමටම ඔවුන්ට ළං වී සිටියහ. එමෙන්ම ඉතා හොඳින් දඩ බල්ලන් සහ දඩමීමුන් රැකබලා ගැනීමටද ඔවුහු කටයුතු

කළහ. දඩයම් සඳහා පුරුදු පුහුණු කළ බල්ලන් දඩ බල්ලන් ලෙස හැඳින්වේ. දඩබල්ලා පුරුදු වූ පසු තම ස්වාමියා එනතෙක් ඌරන්, ගෝනුන්, මුවන් ආදී සතුන් රැක ගෙන එවැනි සතුන්ට යන්නට නොදී රඳවාගෙන සිටීමට දඩ බල්ලන්ට හැකියාව තිබුණි. දඩයක්කරුවා විසින් සතෙකුට වෙඩිල්ලක් තැබූ පසු වෙඩි කෑ සතාගේ ලේ පාර දිගේ ගොස් ඌ වැටී සිටින තැනට යාමට තරම් සමත් කමක් දක්වීය. ඒ යන විට සතා නොමැරී ඇත්නම් ඌ මරා දැමීමටත් දඩබල්ලෝ සමත් විය. දඩමීමාද මේ සඳහා ඉතා හොඳින් හීලෑ කරගත යුතු විය. සමහරවිටක එක් දඩමීමකු කැලෑවට රැගෙන ගිය අතර සමහරවිටක දඩමීමුන් දෙදෙනකුද කැලෑවට රැගෙන ගොස් දඩයම් සඳහා උදව් කරගෙන තිබේ. මොවුන් දඩමීමා කැලෑවට රැගෙන ගොස් ඌට මුවා වී සතුන්ට වෙඩිතබා දඩයම් කරගෙන තිබේ. ඒ දඩයමේදී උගේ සහාය ලබාගත් එක් ක්‍රමයකි. අනිත් ක්‍රමය නම් දඩමීමා කැලෑවට ගෙන ගොස් සතුන් එන පාරේ ගසක බැඳ තබා ඒ මඟින් දඩයම් කර ගැනීමයි. මෙසේ කැලේට ගෙනගිය දඩමීමා සතුන් එන පාරක් ළඟ ඇති ගසක ගැටගසනු ලැබේ. ඉන්පසු දඩයමේ ගිය අය ගසක මැස්සක් තනාගෙන එයට ගොඩ වී සතුන් එනවාදැයි බැලූහ. සතුන් ඇවිදයන පාරේ දඩමීමෙකු සිටින විට ඒ අසලින් ගමන් කිරීමට වල් සතුන් බියක් නොදැක් වූ බව සඳහන් වේ. ඒ නිසා ඒ අසලින් එන සතුන් දඩයම් කර ගැනීමට දඩයක්කරුවන්ට හැකිවිය.

ගමේ කැලෑවට අයත් භූමි ප්‍රදේශයේ දඩයම් කිරීම හා උගුල් ඇටවීම මෙන්ම හේන්වල හානි කිරීම සඳහා පැමිණෙන විවිධ සතුන්ට උගුල් සකසා වගා කටයුතු ආරක්ෂා කිරීම සඳහා විවිධ උපක්‍රම යෙදීමට පුරුදු වී සිටියහ. මේවා දීර්ඝ කාලයක සිට භාවිත කිරීම නිසා මේ පිළිබඳ දැනුම පරම්පරාවෙන් පරම්පරාවට අත්පත් වී ආරක්ෂා වීමට හේතු වී ඇති බව පෙනේ. කැලෑවට ගොස් දඩයම් කිරීම, ඍජු ජීවනෝපායක් ලෙස පවත්වාගෙන ගියහ. එමෙන්ම හේන්වල භෝග ආරක්ෂා කිරීමේදී මරාගත් සමහර සතුන් ද ඔවුන්ගේ දෛනික ජීවිතය සඳහා ප්‍රබල පිටිවහලක් වූ බව සිතිය හැකිය. අනෙක් විශේෂ කාරණය වන්නේ ගැමි සමාජයේ භාවිත වන මේ දඩයම් ක්‍රම බොහොමයක් පාහේ වැදි සමාජය විසින් අනුගමණය කිරීමයි. සාමාන්‍යයෙන් සතුන් ඇල්ලීම සහ උගුල් ඇටවීම සඳහා ගැමියන් තෝරාගන්නේ මඳ වශයෙන් වැසිපොද වැටෙන අන්ධකාර රාත්‍රී කාලයයි.

මිනිසා පරිසරයට අනුවර්තනය වීමෙන් ලද අත්දැකීම් වලින් විවිධ දෑ අත්හදා බලන්නට යොමුවීම තුළ නිරායාසයෙන් හෙල්ලක් වැනි මෙවලමක් හෝ එවැනි යමක් නිර්මාණය කරගත් බව සිතිය හැකිය. මෙලෙස සතුන්ට වඩාත් සමීප නොවී දඩයම් කර ගැනීමට මෙවලමක් නිපද වූ මිනිසාගේ සිතුවිලි වඩාත් සාර්ථක දඩයම් උගුල් ඇටවීමක් දක්වා සංවර්ධනය වීමට වසර දහස් ගණනක් ගත වන්නට ඇත. එසේ සංවර්ධනය වු උගුල් ඇටවීමෙන් සිදුකරන දඩයම ප්‍රධාන වශයෙන් ආකාර දෙකකින් හඳුන්වා දිය හැකිය. ආහාර පිණිස දඩයම සහ වගා ආරක්ෂණ දඩයම යනුවෙන් දෙයාකාර වූ මෙම දඩයම් ක්‍රම සඳහා දඩයක්කරුවා හා ගොවියා ප්‍රධාන වශයෙන් සම්බන්ධ විය. එම දඩයම් ක්‍රම කිහිපයක් මෙසේ සඳහන් කළ හැකිය. (කරුණාතිලක, 2009: 181, විජේසේකර, 2015: 163-167 )

මන්ද බඳින තුවක්කුව

දුම් ගැසීම

තලගොයි හුඹහට මදු ගැසීම

රිලා උගුල

මී හබක

හබක

දඬු මොළය

උල දැමීම

අලි උගුල

ගිරා තොණ්ඩුව

ඉත්තෑ උගුල

වලි කුකුල් උගුල

ගල් දුන්න

බෝරු වල හා මන්ද

කොබෙයි කූඩුව

මී උගුල

කැට පෝලය

වනය තුළ සිදුකරන මෙවැනි දඩයම් සඳහා දඩයක්කරුවන් විසින් මන්ද බඳින තුවක්කුව වැනි ක්‍රම යොදා ගත් අතර මන්ද විශේෂ වූයේ හාවා, මීමින්නාගේ පටන් වල් ඌරන්, මුවන් වැනි සතුන් දක්වා පහසුවෙන් හසු කරගැනීමට හැකි ක්‍රම වේදයක් නිසාය (විජේසේකර, 2015: 163). මදු තැබීම පහළ බෑවුමකදි, හේනේදි, වත්තේදි, කැලේදි සකසා ඇත. හාවාට මදු ගැසුවේ බිම සිට අඟල් 6 ක් පමණ උසින් විය. මේ මදු මුළ ඔවුන් සාදා ගත්තේ කැලේ තිබුණු තද වැල් වලිනි. මෙම උගුල් ක්‍රමය සතාගේ විශාලත්වය අනුව මන්දේ විෂ්කම්භය වෙනස් වෙයි. ගල් බෙනවලට දුම් ගැසීමෙන් ඉත්තෑවන් ඇල්ලීම තලගොයි හුඹහට මඳු ගැසීමද දඩයක්කරුවන්ගේ දඩයම් ක්‍රමවේද වන අතර ඒවා ඉතාම පහසු ක්‍රමවේදයන්ය. එහෙත් මන්දක් යොදන දඩයක්කරුවන් ඒ ඒ සතාගේ ශරීර ප්‍රමාණය පිළිබඳ මනා අවබෝධයකින් යුතු වෙයි. දළ ඌරාට යොදන මන්දත්, මුවාට යොදන මන්දත් එකිනෙකට වෙනස්ය. පැරණි දඩයක්කරුවා හොඳින් සැකසූ වර පොට මන්දක්, හෝ විශේෂයෙන් සකසා ගත් අරළු පට්ට මන්දක් යොදාගත් අතර නවීන දඩයක්කරුවා වානේ කේබල් ඉතා පහසුවෙන් භාවිත කරයි. මෙහිදී මන්ද බඳින තුවක්කුව පිළිබඳ දිනපතා නිරතුරුව දවසේ වැඩි වේලාවක් නිරීක්ෂණ කරමින් සිටීමට මොවුන්ට සිදුවේ.

දුම් ගැසීම සඳහා දඩයක්කරුවන් සිය කාර්ය ඉටුවනතෙක් ම සම්පූර්ණ කාලය ම යොදවයි. මන්ද හා බඳින තුවක්කුව වැනි ක්‍රමවේද වනයේ සතුන්ගේ ගමන් මාර්ග හරහා යොදන බැවින් මිනිසුන්ටද අනතුරුදායක විය. ඌරාට බඳින තුවක්කුව බොහෝදුරට ඌරාගේ හිස කඳ හෝ ගෙල ප්‍රදේශයට වැදුනද සාමාන්‍ය උසින් යුතු මිනිසුන්ට කලව හෝ දණින් පහළට හානිකර වේ. ඌරාට

බඳින තුවක්කුව, මුවාට බඳින්නේ කලාතුරකිනි. ඒ කුඩා මුවකුට විය හැකිය. මෙහිදී උස ප්‍රමාණය පිළිබඳවද සැලකිළිමත් විය යුතු වේ. වඳුරන් මරා ගැනීමට යන දඩයක්කරුවාට වඳුරන් පෙනෙන්නට නැති අවස්ථාවකදී වඳුරන් සොයා ගැනීමේ අපූරු ක්‍රමයක් ද ඔවුන් භාවිත කළහ. එවැනි අවස්ථාවකදී ගෙන යනු ලබන අත්පොරවෙන් ගසක ඇටවුමට තට්ටු කොට එම ශබ්දය වඳුරන්ට ඇසීමට සලස්වා උන් ගෙන්වාගෙන උන්ට වෙඩිතබා මරා ගැනීම හෝ විද මරා ගැනීමට දඩයක්කරුවා සමත්ව ඇත (කරුණාතිලක, 2009: 185). පොරවෙන් ඇටවුමකට ගසනු ලබන විට ඉන් නිකුත් වන ශබ්දය ඇසීමට වඳුරන් ඒ දිශාවට එන බැව් කියවේ. බොහෝ විට මිනිසකු දකින වඳුරන් විසින් කරනු ලබන්නේ මිනිසාට වහන් වීමය. එවැනි අවස්ථාවකදී වඳුරන් සිටින්නේ කොතැනදැයි සොයා බලන දඩයක්කරුවා වඳුරන් අසලට පැමිණෙන්නේ ගස්කොළන් පරළු පොඩි නොවන ආකාරයටය. ඉන්පසු වඳුරකු දකින්නට ලැබුනු විටක මනා ඉලක්කයක් ගෙන ඌට විද මරාගැනීම දඩයක්කරුවාට අසීරු කරුණක් නොවේ. තනිගසක සිටින වඳුරාට විදීමට නොහැකිවන අවස්ථාවලදී දඩයක්කරුවා විසින් කරනු ලබන්නේ තමන් විසින් ගෙනයනු ලබන දුන්න හෝ කැටපෝලය උපයෝගි කොට ඌට ඊතල හෝ ගල් විදීමය (විජේසේකර, 2015: 164). එසේ විදින ලද ගල් ඇඟ වැදුණු පසු වඳුරා ගසෙන් බිමට පැන දිවයයි. පසුව ඒ අසල සිටින දඩයක්කරුවාගේ බල්ලා විසින් වඳුරා ලුහු බැඳ මරාගනී.

හබක ප්‍රධාන දඩයම් ක්‍රමයක් වන අතර මෙය සතුන් ජීවිතක්ෂයට පත්කිරීම සහ සතුන් ජීවග්‍රහයෙන් අල්ලා ගැනීමට අටවනු ලබයි (රණසිංහ, 2009: 165). මීයා, හාවා, මීමින්නා, තලගොයා, ඌරා, මුවා, ගෝනා වැනි සතුන් සඳහා මෙම හබක ඇටවීම සිදුකෙරේ. හේන් වගා කටයුතු සිදුකරන ප්‍රදේශවල හේන් භූමිය වටා ඇති දඬුවැටෙහි තැනින් තැන සතුන් ඉලක්ක කර හබක අටවා තිබෙන අතර එම හබක හරහා ගමන් කරන සතුන් ජීවිතක්ෂයට පත් වේ. එහෙත් අලියා, කුළු මී ගවයා සහ රිළවා මෙන්ම ගිරවා, මොණරා, වලි කුකුළා, ආයිත්තියා වැනි පක්ෂීන් ජීවග්‍රහයෙන් අල්ලා ගැනීමට දෙවන හබක වර්ගය භාවිත කරයි. ජීවග්‍රහයෙන් සතුන් අල්ලා ගැනීමේදී සතාට හානියක් වීම හෝ සතාගෙන් දඩයක්කරුට හානියක් වීමට ඇති ඉඩකඩ වැඩි බැවින් කල්පනාකාරී විය යුතුය. හබක ගැස්සීම

සිදුවන්නේ ඉලක්කගත සතාගේ ශරීර ස්පර්ශය, පා පැටලීම, පෑගීම, ඇම ඇදීම මගින්ය. මරු වැල පැනීම හෝ ගැස්සුම් ඉපියා පැනීම මත ඇසිල්ලකින් ශරීරය මත ගල්කුට්ටි හා දැව කඳන් පතිත වන බැවින් සතාට පැන යාමට ඉඩක් නොමැත (නොක්ස්, 2017, 109). සතාගේ ශරීර ප්‍රමාණය සහ බර අනුව හබක ඇටවීම වෙනස් වේ.

ශ්‍රී ලංකාවේ ගොවිබිම්වල වගා ආරක්ෂාව සඳහා යොදා ගැනෙන දඩයම් ක්‍රමයක්ද ඇත. හේනක දඬුවැට ප්‍රධානත්වයක් ගනී. හේනේ අටවන උගුල් හෝ හබක නැතිනම් දඬුමොළය යන්න ද සෘජුවම සම්බන්ධ වන ප්‍රධාන අංගය වන්නේ දඬුවැටයි. හේනේ ආරක්ෂාව කෘතිමව යොදන ලද දඬුවැට ඉතා ශක්තිමත්ව සකසන ලද්දකි. එයින් වගාබිමට ඇතුලුවන හානිකර සතුන් වලකාලයි. එහෙත් දඬුවැට අබල දුබල වනවිට හේනේ ආරක්ෂාවට විවිධ උපක්‍රම යොදන්නට ගොවියා පෙළඹුණි. දඬුවැට නිරන්තර ශක්තිමත්ව තබාගන්නට උත්සාහ කළ ද විවිධ සතුන්ගේ හානිදායක තත්ත්වයක් ඇතිවන විට ඒවාට විකල්ප වශයෙන් දඩයම් උගුල් යෙදීය. මෙසේ යොදන දඩයම් උපක්‍රම සරල හෝ සංකීර්ණ ඒවා විය හැකිය. ඒ ආකාරයට වගා ආරක්ෂණ ක්‍රියාමාර්ග යක් ලෙස උගුල් ඇට වූ ගැමියෝ කල් ගතවත්ම නිරන්තරයෙන් දඩයම් සඳහා හේනේ උගුලක් හෝ හබකක් ඇටවීම අනිවාර්යයෙන්ම සිදුකරන ලදි.

මෙලෙස සාම්ප්‍රදායික ගැමි පරිසරයන්හි තම හේනේ හා කුඹුරේ වගාවට විවිධ සතුන්ගෙන් ඇතිවන හානිය වළක්වා ගැනීම සඳහා දඩයමෙහි යෙදුනේ සාම්ප්‍රදායික ගොවියෝය. හේන් ගොවියන්ගේ දඩයම් ක්‍රමවේදයන්හි සුවිශේෂත්වය වූයේ මේ සඳහා ගොවීන්ට අමතරව කාලයක් වැය කිරීමට අවශ්‍ය නොවීමත් මේවා ඉතාමත් සාර්ථක ක්‍රමවේදයන් වීමත් ය. එහෙත් හේන් ගොවියාගේ අරමුණ දඩයම නොව තම ජීවය වූ වගාව ආරක්ෂා කර ගැනීමයි. මේ සඳහා විවිධ ක්‍රම යොදා ගත්තේ සතුන් තම වගා බිමට ඇතුළු වීම වළක්වාලීම සඳහාය. එහිදී එම උපක්‍රම දඩයම සඳහාම මෙහෙයවීය. එයින් ගොවියා අමතර ප්‍රතිලාභයක් ලබාගන්නා ලදි. ඒ අනුව ගොවිජනයා තම වගාව ආරක්ෂා කිරීමක් වශයෙන් හේනේ යෙදෙන උගුල් වලින් සතුන් අල්ලා ගත්තේ දඩයක්කාරයා මෙන් ඒ සඳහා ම කාලයක් යෙදවීමෙන් නොවීම විශේෂත්වයකි. එසේම

දඩයක්කාරයාගේ උගුල, හබක මෙන් නොව ගොවියාගේ උගුලට, හබකට සතුන් හසුවීම පිළිබඳ විශ්වාසය ඉතාමත් වැඩිය. ඊට හේතුව මෙම ක්‍රමවේදයන් තුළ පවතින විවිධත්වයක් නොව එකම ක්‍රමවේදය තුළ ඊට ආධාරවන පරිසරය බොහෝ දුරට හේතු වෙයි. හේනට ඇතුලුවීමට තැත් කරන සතුන්ට දඬුවැට සම්බන්ධ කොට අටවන උගුල් හෝ හබක මගින් හසු නොවී පලායාම ඉතා නිරර්ථක වෑයමකි. එහෙත් කැලෑ තුළ අටවන උගුලකට සතෙකු හසුවන ප්‍රවණතාවය තරමක් අඩුය. ඊට හේතු වන්නේ නිරන්තරයෙන්ම සතුන් ගමන් කරන මාර්ගයක් විවිධ හේතුන් මත සුළු වශයෙන් හෝ වෙනස් වීමට ඉඩකඩ තිබෙන බැවිනි.

පතහ නම් උගුල් ක්‍රමයක් ඌරා, මුවා, ගෝනා ආදී සතුන් එන මං සලකුණු බලා සකසන ලදි. එවැනි මාවත් වල අඩි 6 ක් පමණ දිගට, අඩි 4 ක් පමණ පළලට අඩි 5 ක් පමණ ගැඹුරට වන ලෙස වළක් කපා ගන්නා ලදි. උස අඩි හතර හමාරක් පමණ වූ කොරකහ වැනි තද වර්ගයේ ලී කෝටු ගෙන එහි කෙළවර හොඳින් උල් කර ගන්නා ලදි. මේ කෝටුවල උල ඉහළට සිටින සේ අඩි එක හමාරක් පමණ පොළවට බස්සවන ලදි. මෙසේ සාදාගත් වළ මතුපිට හරහට වේලුණු ලී අතුරා ඒ මත පරළු දමා වළ, බොරු වළක් ලෙස සකසා ගන්නා ලදි. මෙම වළ මත වැටෙන සතුන් උල් ඇනීමෙන් මිය යයි.

දඬුමොළය නම් උගුල් විශේෂය සීගිරිය ප්‍රදේශය තුළ හඳුනාගත් මෙතෙක් වාර්තා නොවූ අප්‍රකට දඩයම් ක්‍රමවේදයක් ලෙස පෙන්වාදිය හැකිය. ගල් උගුලක් ලෙස හඳුනාගතහැකි මෙයට දූවැන්ත වල් ඌරන් පහසුවෙන් හසුවෙයි. කැලෑව තුළ හබකක් හෝ දඬුමොළයක් සතුන් යන මාර්ග එල්ලකොට ඇටවීමෙන් අනිවාර්යෙන් හසුවෙතියි සිතීමේ ප්‍රවණතාව තරමක් අඩුය. එහෙත් වල් ඌරා මුවන් හෝ වෙනත් සතෙකු වගා බිමකට ඇතුලු වන්නේ දඬුවැටේ ඇතුලුවිය හැකි පහසු ම ස්ථානයකිනි. එවැනි තැනක නොවරදින හබක හෝ දඬුමොළය ඇටවීමෙන් දඩයම සාර්ථකව ඉටුවෙයි. කැලෑවේ අටවන උගුල්වලත්, හේනේ අටවන උගුල්වලත් සාර්ථකත්වය පිළිබඳ විශ්වාසය එලෙස තීරණය කිරීමට හැකියාවක් පවතී. ලූල ද එවැනි දඬුවැටට සම්බන්ධ සාර්ථක උගුල් ක්‍රමයකි.

සීගිරියේ දැනට දශක දෙක තුනකට පෙර පැවැති උල දැමීම නම් ක්‍රමය ගෝනා, මුවා, මීමින්නා අදී සතුන්ට යෙදූ අති අමානුෂික දඩයම් ක්‍රමවේදයකි. මෙයද දඬුවැට හෝ එවැනි තෝරාගත් ආවරණයක දුර්වල ස්ථානයකට යොදනු ලබන දඩයම් ක්‍රමයකි. ගෝනා, මුවා, මීමින්නා වැනි සතුන්ගේ, දඬුවැටෙන් පනින වේගය හා දුර ප්‍රමාණය ද ඉදිරි ගාත්‍රා අතර දුරෙහි මධ්‍යය ද නිවැරදිව අවබෝධ කොටගෙන අංශක 25-35 දක්වා ඇලව යොදනු ලබන උලෙහි ඇනීමෙන් සතුන් හසුකර ගැනීම මෙමගින් සිදුවේ. දඬුවැටෙන් ඇතුළත වගාබිමට ඇතුලු වීමට සතුන් දරන උත්සාහය නිදැල්ලේ කැලෑව තුළ ගමන් කිරීමේදී හමුවන බාධකවලින් පැනීමට ගන්නා උත්සාහයට වඩාත් වැඩිය. මෙවන් විටක හේන් ගොවියාගේ දඩයම් ක්‍රමවේද ක්‍රියාත්මක වෙයි. එයට දඬුවැට ප්‍රබල දායකත්වයක් ලබාදෙයි.

ගිරවා වැනි අහිංසක කුරුල්ලකු දඩයක්කරුගේ උගුලකට හසුවීම සිදුනොවන තරමට ඉතාමත් දුර්ලභය. එනම් දඩයක්කරුට මෙවැනි කුඩා කුරුල්ලකු දඩයමට කාලය, ශ්‍රමය යෙදවීම ඉතා නිෂ්පලය. එහෙත් ගොවියා සිය අක්කර 2, 3 ක හේන, ගිරවා සඳහා ඇට වූ ගිරාතොණ්ඩු ප්‍රමාණය 10-15 ක් පමණ ප්‍රමාණයකි. ගොවියාගේ ගිරා තොණ්ඩුවට හසුවන ගිරවුන්ද මීට දශක කිහිපයකට පෙර පුළුස්සාගෙන ආහාරයට ගත්තද ඔවුන් ගිරවුන් සඳහා මෙලෙස මල ඇටවූයේ මස් පිණිස නොව සිය වගාව (බඩ ඉරිඟු, මෑ කරල් වැනි) ආරක්ෂා කරගැනීම අරමුණෙනි. ගිරවා ඇල්ලීමට ද ගොවියා ඉතාමත් ම සරල ක්‍රමවේදයක් භාවිත කර ඇත. තොණ්ඩුව සහිත වරපටක් මා දුන්නක් මෙන් නමාගත හැකි ලීයක් ද මේ සඳහා පහසුවෙන් යොදා ගත්ත ද වර්තමාන හේන් ගොවියා ද මෙවැනි ක්‍රමවේද වලින් බැහැරවන තත්ත්වයක් පවතී.

ගොවීන් විසින් හේනේ අටවන ඇතැම් උගුල් ක්‍රම දඩයක්කරුවන් කැලෑව තුළ ද අටවයි. ඉත්තෑ උගුල, වලිකුකුල් උගුල මේ අතරින් ප්‍රධාන වේ. තැනින් තැන අටවන වලිකුකුල් උගුලට වලිකුකුළන් ප්‍රියකරන රොඩු, හාල් ඇට හෝ එවැනි යමක් දැමීමෙන් වලිකුකුළාට උගුල වෙත යන මාර්ගය සලසා දීමෙන් පහසුවෙන් උගුලට හසුවන අතර මෙම ක්‍රමවේදය හේනේ ද එලෙස ම යොදාගෙන තිබේ. හේනේ හෝ කැලෑවේ අටවන කබල්ලෑ හෝ

ඉත්තෑ උගුලෙහි ද කිසිදු වෙනසක් නොමැත. ඊට හේතුව උගුලට හසුවීම සඳහා භාවිත කර ඇති තාක්ෂණික ක්‍රමවේදවල හා ආධාර කරගන්නා බාහිර පරිසර අවශ්‍යතාවල වෙනසක් නොවීමයි. උගුලට හසු වූ පසු වරපට කපාගෙන පලායාමට නොහැකි පරිදි ඉත්තෑවා, කබල්ලෑවාගේ ආවේණික ලක්ෂණ පදනම් කරගෙන ගෙල සිරවන පරිදි තොණ්ඩුව යොදා තිබීම මෙම උගුල් තාක්ෂණික ක්‍රමවේදයේ පවතින විශේෂත්වයයි. බොරුවල වැනි උපක්‍රම හේනට වඩා කැලයේ සතුන්ගේ ගමන් මාර්ග ඉලක්ක කොට යෙදීම වඩාත් ප්‍රතිඵලදායකය. හේනක් තුළ බොරු වලක් සෑදීම අවශ්‍යවන්නේ හාවකු, මී මින්නෙකු, ඉත්තෑවකු දඬුවැටේ උගුල් වලින් බේරී වගාබිමට ඇතුලු වුවහොත් පමණි. කැලෑවක සකසන බොරුවල ඉතා සාර්ථකය (ගුණවර්ධන, 2004, 113).

ආහාරය සඳහා මත්ස්‍යයින් අල්ලාගැනීම හැරුණු විට විනෝදය පිණිස මත්ස්‍යයින් ඇති කිරීම සිදු වී ඇත. අනෙක් අතට ආහාරය සඳහා මත්ස්‍යයින් අල්ලීම හැම කෙනෙකුටම තහනම් වූ ක්‍රියාවක් බව රොබට් නොක්ස් සඳහන් කරයි. බොහෝ ගම්වැව් සිඳීගිය ජූලි මාසයෙන් පසුව සැප්තැම්බර් මස හැරුණු විට අවුරුද්ද පුරා මත්ස්‍යයින් ඇල්ලීම සිදුකෙරේ. මත්ස්‍යයින් අල්ලීමේදී "කරප් ගෙඩිය" ක්‍රමය මගින් බහුල වශයෙන් මත්ස්‍යයින් අල්ලාගෙන ඇත (නොක්ස්, 2017, 125). "කරප් ගෙඩිය" ක්‍රමය යනු කූඩයක් වතුරට බස්සවා ඇදීම මගින් මත්ස්‍යයින් අල්ලාගැනීමේ ක්‍රමයයි. විශේෂයෙන් ජලය බැස ගිය අවස්ථාවක හෝ එය නොගැඹුරු ස්ථානවල මේ ක්‍රමය ඉතා පහසුවෙන් සිදුකළ හැකිය. සිහින් කෝටු වේවැල් භාවිත කරමින් නිර්මාණය කළ කූඩයක් බඳු උපකරණයක් මේ සඳහා යොදා ගනී. මත්ස්‍යයින්ට පිටතට ඒමට නොහැකි ලෙස එය සකස් කර ඇත. මත්ස්‍යයින් ඇතැයි අනුමාන කරන ස්ථානවල මේ උපකරණ ඇරෙන පරිද්දෙන් යොදාගැනීමේදී එහි ඇතුළට මත්ස්‍යයින් අසුවේ. නිර්මාණයේ ඉහළ කොටසේ ඇති හිස් අවකාශයක් ඇතුළට අත දමා මත්ස්‍යයින් අල්ලා කරමලය සිදුරු කොට වැලක අමුණාගැනීමෙන් නැවත කරක උපකරණයෙන් මත්ස්‍යයින් අල්ලාගැනීම සිදුකළ හැකිය (නොක්ස්, 2017, 127).

වස විස ජලයට මුසුකර මත්ස්‍යයින් මැරීමට සැලැස්වීමෙන්ද මත්ස්‍යයින් අල්ලාගැනීම සිදුකර ඇත. මෙය ද පුරාණයේ සිට ගැමියන් අනුගමනය කළ ක්‍රමයක් බව පැහැදිලිය (විජේසේකර, 2015ඃ 165). මෙහිදී විශේෂයෙන් විස සහිත කොකු, මුල් ආදිය යොදා ගනියි. සීගිරි තදාශ්‍රිතයේ කලවැල් මුල් ආදිය ජලයෙන් මුසු කිරීමෙන් මත්ස්‍යයින් මරාගැනීම සුලභව අනුගමනය කරන ක්‍රමයක් ලෙස සඳහන් කළ හැකිය. සමන්තපාසාදිකාවේ සඳහන් විස්තර අනුව පෙනී යන්නේ නිදහස් අතින් මත්ස්‍යයින් ඇල්ලීම පුරාණයේ සිට ගැමියන් අනුගමනය කර ඇති තවත් විධික්‍රමයක් බවයි (බුද්ධඝෝෂ, 2004ඃ 361). මෙහිදී කුඩා ජලාශ්‍රිත තැන්වල පිරී තිබූ ජලය ඉවත් කොට ඉක්බිතිව මත්ස්‍යයින් අල්ලාගනියි. මේ ක්‍රමය තත්කාලීන 19 වන සියවස සමාජයේ ඉතා ජනප්‍රියව පැවැති බවට කරුණු දක්වන හෙන්රි පාකර් ගැමි සමාජයේ මෙන්ම වැදි සමාජය තුළ ද භාවිත කරන බව දක්වයි.

විසිදැල භාවිත කරනුයේ ජලය පිරී ඇති වැව්වල මත්ස්‍යයින් අල්ලාගැනීම සඳහා ය. මෙය තාක්ෂණය අතින් තරමක් දියුණු ක්‍රමයකි. රජරට ප්‍රදේශයේ ඊසානදිග මෝසම් සුළං කාලයේදී විසිදැල වැව් මත සකස් කරනු ලැබේ (ගුණවර්ධන, 2004, 116). එය දැව කණු දෙකක් ආධාරයෙන් අඩි 6 ක් පමණ ගැඹුරට සකස් කෙරේ. "දැල" යන වචනය සමන්තපාසාදිකාවේ කියවෙන බැවින් මෙයද පුරාණයේ සිටම මසුන් මැරීම සඳහා භාවිත කළ ක්‍රමයක් ලෙස සිතිය හැකිය (බුද්ධඝෝෂ, 2004ඃ 311). එසේ වුව ද රොබට් නොක්ස්ගේ ලියකිවිවල මේ සඳහා එතරම් වැදගත් තැනක් ලබා නොදීම අනුව පෙනීයන්නේ 17 වෙනි සියවසෙහිදී දැල් ක්‍රමයට මත්ස්‍යයින් මැරීම ජනප්‍රිය බවින් අඩු වී තිබූ බවයි. තවද " ජලය සම්පූර්ණයෙන් නොසින්දවා ඇවිදීමට හැකිතරමට ජලය ශේෂ වූ කල්හි මිනිසුන් හෝ මී හරකුන් විසින් එය මඩකරවනු ලබයි. එයින් අන්ධ වූ මත්ස්‍යයෝ දිය මතුපිට පාවෙති. එවිට පොලු ගැසීමෙන් ද අතින්ද නැතහොත් කුඩ භාවිත කරමින් ඒ මත්ස්‍යයෝ අල්ලාගත හැකිය.

කෙමන යනුවෙන් හඳුන්වන මත්ස්‍යයින් මැරීම සඳහා භාවිත කරන ක්‍රමය ද පුරාණ කාලයේ සිට භාවිත වූවක් බව පෙනේ. වේවැල් භාවිත කරමින් සකස් කළ සිලින්ඩාකාර උපකරණයක් වූ මෙය ජලය ඇති තැන්වල තැන්පත් කොට මත්ස්‍යයින් එකතු කරගනු

ලැබේ (විජේසේකර, 2015: 165). මේ සඳහා මත්ස්‍යයින් කෙමන වෙත ඇදගැනීම සඳහා ශාකද්‍රව්‍ය, වෙනත් කෑම වර්ග දමන අතර මේ මත පහන් දැල්වීම මඟින් ද මත්ස්‍යයින් එකතු කරගත හැකිය. මෙහි විශේෂතාව වන්නේ සෑම පැය හතරකට පහකට වරක් කෙමන පරීක්ෂාවට ලක්කිරීමයි. බිලී කොකු භාවිතයද මත්ස්‍යයින් මරාගැනීම සඳහා භාවිත කළ පුරාණයේ සිට පැවැත එන ක්‍රමයකි. ආඳා, ලූලා, මඩාරා, තෙලියා, තිත්තයා, වැලිගොව්වා, කනයා, හිරිකණයා, අංකුට්ටා, හුන්ගා, කොරලියා, තෙප්පිලියා, කොකයා, මගුරා, පෙතියා, මල් කොරලියා ආදි මත්ස්‍යයින් කෙමනට හසුවන ප්‍රධාන මත්ස්‍යයින් වේ.

### දඩමස් පංගු බෙදීම

දඩයක්කරුවා කොතරම් අසීරුවෙන් දඩයම් කළද, ඔවුහු ඒ සම්බන්ධ වූ යුතුකම් ඉටුකළහ. අනෙක් සෑම දෙයකටම වාගේ දඩයමට සම්බන්ධ වූ මේ සම්මත බිඳීමට ඔවුහු එතරම් කැමැත්තක් නොදැක් වූහ. එදා සතෙකු මරාගත් දඩයක්කරුවා එකී සම්මතයන්ට අනුව එම මස්වලින් ගමේ බෙදාදිය යුතු අයට මස් බෙදා දී තිබේ. කාලයෙන් කාලයට මේ සම්මතවලින් කිසියම් කොටස් අඩු වී ඇති බැව් අද පෙනී යයි. දඩයක්කරුවන් සතෙකු මරාගත් පසු මස් බෙදාගෙන ඇත්තේ පහත සඳහන් පරිදිය.

දඩයමක් කර අවසන් වූ පසු සතා මස් කළ යුතුය. එය හඳුන්වන්නේ "සතා කැපීම" යනුවෙනි. සතා මස්කර අවසන් කළ පසු පංගු බෙදිය යුතුය. චිරාගත සම්ප්‍රදායකට අනුව පංගු බෙදීම කෙරේ. ගෝන, මුව, ඌරු වැනි විශාල සතුන් දඩයම් කළ විට එසේ පංගු බෙදිය යුතු විය. කුඩා සතුන් දඩයමේදි එවැනි බෙදීමක් නොකෙරිණි.

01. ගම කොටහ

02. ගුරු මාළු

03. තුවක්කු අඳේ හා එල්ලුම්පොට

04. කැපුම්නියමේ

05. දඩයම් පංගුව

06. හවුල් පංගු

01. ගම කොටහ

ගමේ ප්‍රධානියා වූ ගමරාළට තෑගි වශයෙන් දෙන කොටස ගම පංගුව වශයෙන් හැඳින්වේ. සතාගේ ගාතයක මස් ගම පංගුව සඳහා වෙන් කෙරේ. එම කොටස ගමරාලගේ නිවහනට ගෙන ගොස් දිය යුතුය.

**02. ගුරු මාළු**

දඩයම් කළ සතාගේ ගාතයකින් මස් තීරු දෙකක් ගුරු මාළු වශයෙන් වෙන් කෙරේ. දඩයම් ඉගැන් වූ ගුරුවරයා ජීවතුන් අතර නැත්නම් ගුරුමාළු කොටහ දඩයක්කාරයාට අයත් වේ. දඩයකුන් පිදීමට ගුරුමාළු යොදා ගැනීමට දඩයක්කාරයෝ අමතක නොකරති.

**03. තුවක්කු අඳේ හා එල්ලුම්පොට**

තුවක්කු අයිතිකරුට ගාතයක මස් දිය යුතුය. තුවක්කු අඳේ වශයෙන් ලබන මස් ගාතයට අමතරව වේලකට සෑහෙන මස් පංගුවක් පට්ටයක අමුණා වෙන් කළ මස් ගාතයේ එල්ලයි. මෙසේ එල්ලන නිසා ඊට "එල්ලුම් පොට"යන නම ලැබී ඇත. එය තුවක්කු හිමියාට දෙන්නේ තෑග්ගක් වශයෙනි. තුවක්කුව දඩයක්කාරයාට අයත්නම් එල්ලුම්පොට වෙන් කිරීම නොකෙරේ.

**04. කැපුම්නියමේ**

සතා කපා මස් කළ තැනැත්තාට හිමිවන පංගුව මෙනමින් හැඳින්වේ. දඩයමට හවුල් වූ අනෙක් උදව්කාරයන්ට සමාන පංගුවක් කැපුන්කාරයන්ට හිමිවේ. ඊට අමතරව අත්ගොබ හා බඩපොලේ යන කොටස්වලින් ද කපාගත් මස් කොටසක් කැපුම් නියමේ පංගුවට එක්කළ යුතුයි.

**05. දඩයම් පංගුව**

දඩයම් කළ සතාගේ මස්වලින් වැඩිම පංගුව දඩයක්කාරයාට හිමිවේ. සතාගේ අක්මාව වකුගඩු සහ හදවත වැනි පීකුදු කොටස්

ද ඔහුට අයත් වේ. සතාගේ දිවත් උගුරු දණ්ඩත් අතර කොටස අඳ මාළුව නම් වේ. එයත් දඩයක්කාරයාට හිමිවිය යුතුය. සතාගේ හිසේ මස් කොටස ද දඩයක්කාරයාට හිමි වෙයි. ඒවා හඳුන්වන්නේ ඉස්මාළු හෙවත් හොබර මාළු නමින්ය. අඳ මාළු හා හොබර මාළු උයා දඩයම්යකුන්ට පූජා කිරීමට දඩයක්කාරයෝ අමතක නොකරති.

## 06. හවුල් පංගු

දඩයමට විවිධාකාරයෙන් උදව් වූ අයට කොටස් වෙන් කිරීම හවුල් පංගු වෙන් කිරීම වන අතර පසු ඉතිරි කොටස් දඩයමේ ගිය පිරිස අතරේ සමසේ බෙදේ. දඩයමට යාමේදී බොහෝ විට කණ්ඩායමට අයත් වන්නේ තිදෙනෙකි. ඊට වඩා ලොකු කණ්ඩායම් හැදීමට ඔවුන් අකැමැතිවන්නේ ලැබෙන මස් පංගුව කුඩාවන බැවිනි. කැලේ දින දෙක තුනක් රැඳී සිට සතුන් දඩයමේදී ඔවුහු මුලින්ම කළේ තමන් මරාගත් සතා කපා උගේ මස් කොටස් වෙන්කොට ගෙන ඒවායෙන් කොටසක් තමන් රැඳී සිටි පැන්නුල අසලදී ඉඳිගොල්ලේ කිරි අම්මා ඇතුළු තමන් බාර වූ යකින්නන්ට බාරය ඔප්පු කිරීමය. ගම් වැසියෝ මුලදී මස් පංගු බෙදූ ආකාරය පසුකාලීනව වෙනස් වී තිබේ. පසුව ඔවුන් කර ඇත්තේ ආරච්චි මහතාට කොටසක් වෙන් කිරීමත්, ගමේ පවුල්වලට එක පවුලකට රාත්තල් තුනක් පමණ ලැබෙන සේ මස් කොටසක් වෙන් කිරීමත් ඉතිරිය දඩයමේ ගිය අය අතර බෙදා ගැනීමත් ය. ආරච්චි මහතාගේ මස් පංගුව ගෙන ගොස් දුන්නේ දඩයක්කරු විසිනි. දඩයම් කළ කණ්ඩායම ඉන්පසුව ගමේ පවුල්වලට මස් පංගු වෙන් කිරීමය. මෙය "මස් කොට්ටහ"ලෙස හඳුන්වයි. ඉන්පසු තමතමන්ට අවශ්‍ය මස් පංගු බෙදා ගත්හ. සෑම පළාතකම පාහේ දඩයමෙන් පසු දඩමස් පංගු කිරීම දක්නට ලැබේ. මෙමඟින් ගමේ පිරිස් අතර සුහද බව වර්ධනය වීමට හේතුවක් විය.

## නිගමනය

දඩයමෙන් වගා අරක්ෂා කිරීම හා කුසගින්න නිවා ගැනීම සිදු වූ අතර බොහෝ සමාජයන් එළිපිට මෙය ප්‍රතික්ෂේප කළහ. මේ නිසාම අලුත් පරම්පරාවට මෙවැනි ක්‍රමවේද ඉගැන්වීමෙන් පවා වැළකී සිටීමට තරම් ගැමියෝ කටයුතු කළහ. බොහෝ දඩයම් ක්‍රමවේද වර්තමානය වන විට තරමක් දුරට බැහැර වූ ඒවා වන අතර කාලයක් සමඟ

ගම්මුන්ගේ මතකයෙන් ද ගිලිහී ඇත. දඩයම පාරිසරික වශයෙන් අයහපත් කාර්යයක් වුව ද ඔවුන්ගේ ඒ පිළිබඳ වූ ශිල්පීය තාක්ෂණික ඥානය අගය කළ යුත්තකි. මෙවැනි දඩයම පිළිබඳ විශිෂ්ට ඥානයක් සහ චාරිත්‍ර වාරිත්‍ර ග්‍රාමීය ජන සංස්කෘතියෙන් වියැකීයාම එක් අතකින් ග්‍රාමීය මානව සමාජ සංස්කෘතියේ අවාසනාවන්ත තත්ත්වයකි. ඒ අනුව මානවවංශ විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමේදී ශ්‍රී ලංකාවේ පුරාණ දඩයම සහ චාරිත්‍රවාරිත්‍ර අතිශයින් වැදගත් වූත් වටිනා වූත් විෂය ක්ෂේත්‍රයක් ලෙස පුළුල්ව පර්යේෂණ කළ යුතුව ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ඇල්ෆ්‍රඩ් ක්ලාක් (2006) ලක්දිව වනගත දඩකෙළ (Sport in the Low-Country of Ceylon සිංහල පරිවර්තනය - එස්. ජයකොඩි) සදීපා ප්‍රකාශන මන්දිරය, මරදාන පාර, බොරැල්ල

උඩවත්ත, පියදාස (2007) වැදිජන ගොත, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

කරුණාතිලක, එම් (2009) ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දඩයම් ක්‍රමවේදයන්හි සුවිශේෂතා හඳුනාගැනීම, පුරාවිද්‍යා වාර්ෂික සමුළුව 180 - 187 පිටුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවල, කොළඹ 07.

ගුණවර්ධන, ප්‍රිශාන්ත (2004) පුරාණ ගම, සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජා-ඇල

ඩේවි, ජෝන් (1967) ඩේවි දුටු ලංකාව, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොටුව.

නන්දදේව විජේසේකර (2015) ලංකා ජනතාව, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

නොක්ස්, රොබට් (1958) එදා හෙළ දිව (An Historical Relation of the Island of Ceylon සිංහල පරිවර්තන - ඩේවිඩ් කරුණාරත්න), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොටුව.

බිංදුහේවා, එස් (2005) ධීවර ආම්පන්න තාක්ෂණය ස ඇල්ලීමේ ක්‍රම, තරංජී ප්‍රින්ට්ස්, මහරගම.

බුද්ධඝෝෂ ස්ථිවිරපාද (2004) සමන්තපාසාදිකාව (සමන්තපාසාදිකා විනයට්ඨකථා සිංහල පරිවර්තනය - අම්බලන්ගොඩ ධම්මකුසල නාහිමි) ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය.

පීරිස්, රැල්ෆ් (1964) උඩරට සිංහල සමාජ සංවිධාන, සමන් ප්‍රකාශකයෝ, කොළඹ

රණසිංහ, ජී (2009) ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දඩයම් උගුල් අතර හබකයෙහි ප්‍රායෝගික භාවිතය, පුරාවිද්‍යා වාර්ෂික සමුළුව 165 - 167 පිටුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07.